**ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි දෙපාර්තමේන්තු පොත් අනුව අවසාන ශේෂය රු.20,297,664 ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.20,285,893 ක් විය, එම ශේෂයන් අතර වෙනස වූ රු.11,772 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ ගණනාවක සිට පැවති අත්තිකාරම් ගිණුමෙහි වෙනස නිවැරදි කිරීමේ දී තවදුරටත් සොයාගත නොහැකි වටිනාකමක් ලෙස රු.11,772/- ක් පවතින අතර එය ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතු වේ. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂ 05 කට වරක් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහනවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු නොකර රු.17,484,320 ක් ලෙස අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ඉදිරි වසර තුළදී (2024) වාහනවල තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම 2023 අගෝස්තු 26 දින ද, මහනුවර ශාඛා කාර්යාලය පිහිටි ඉඩම 2022 ජූලි 20 දින ද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණු නමුත්, එම ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 2012 වර්ෂයේ සිට කාර්යාල කටයුතු සඳහා භාවිතා කරන නව B ගොඩනැගිල්ලේ හා | B ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ඇත. A ගොඩනැගිල්ලේ දැනට ප්‍රතිසංස්කරණ කටයුතු අවසන්ව නොමැති අතර ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමෙන් පසු තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

2023 දෙසැම්බර් 31 දිනට අලුත්වැඩියා පිරිවැය රු.470,780,777 ක් වූ ප්‍රතිසංස්කරණ කටයුතු අත්හැර දමා පවතින ප්‍රධාන කාර්යාල A ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳ කාලීනව සමාලෝචනය කර 2024 වර්ෂයේ සිට විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.2. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 3.1 ඡේදයේ මුදල් රෙගුලාසි 113 (6) (ආ) යටතේ අත්තිකාරම් (බී) ගිණුම මඟින් ලබා දුන් ණය අයකර ගැනීමේදී කටයුතු කල යුතු මාර්ගෝපදේශ අංක 01 | 1,028,929 | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයකරගත යුතු වසර 20 ක් ඉක්මවූ රු.123,614 ක් හා මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 01 ත් 03 ත් අතර | අයකර ගැනීමට ලිපි යොමු කර ඇත. | මාර්ගෝපදේශ අංක 01 හි (අ), (ආ) සහ (ඉ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | කාලයක් හිඟහිටි රු.1,028,929 ක ණය ශේෂයත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1. සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ලේඛන ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.50,000,000 කින් 2023 වසරේදී ඉදිකර අවසන් කිරීමට සැලසුම් කළ ජංගම රාක්ක පද්ධතියේ 2023 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 05 ක් පමණක් වූ අතර, මූල්‍ය ප්‍රගතියක් නොවුණි. | මේ වන විට සුදුසු සැපයුම්කරුවකු වෙත ලංසු ලබා ගැනීම සඳහා ලංසු විවෘත කර ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | සැලසුම් ප්‍රකාරව ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |

3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටෙරාබයිට් 500 ක ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීමට 2021 අප්‍රේල් 05 දින ලබාදී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව වසර 05 ක් තුළ රු.120,208,320 ක පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව රු.78,300,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ ගිවිසුම්ගත වීමට නියමිතව තිබුණ ද 2023 සැප්තැම්බර් 19 දින මාගේ DNA/15/ARO1/1/1(11) ලිපියට පිළිතුරු ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති විසින් එවූ ලිපිය මඟින් කාර්ය මණ්ඩල ඌනතා ආදිය සඳහන් කරමින් විශේෂඥ දැනුමැති සහය ලබා ගන්නා ලෙස දන්වා ඇත. රජයේ අමාත්‍යාංශ ලේකම්ගේ MBRCA/03/PRO/02/SOFTWARE අංක දරන හා 2024 මාර්තු 14 දිනැති ලිපිය මඟින් උපදේශකවරුන් තෝරාගැනීම සඳහා වන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සඳහා සාකච්ඡා සිදු කරමින් පවතී. | ඩිජිටල් කෝෂ්ඨාගාරය පිහිටුවීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ඉටුකළ යුතු වන බව. |

## 3.3. වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ලේ සවිකරන ලද CCTV කැමරා 23 කින් මේ දක්වා ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කැමරා සංඛ්‍යාව 09 ක් පමණක් වූ අතර, අක්‍රීය තත්ත්වයේ පවතින ඉතිරි කැමරා 14 අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රමාණවත් පරිදි නව කැමරා සවි කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක තත්ත්වයේ පැවති කැමරා අත්‍යාවශ්‍යම ස්ථාන ආවරණය වන පරිදි නැවත ස්ථානගත කරන අතර නව කැමරා 03 ක් හා Network Switch 02 අළුත්වැඩියා කර සවිකරණ ලදී. නව CCTV කැමරා පද්ධතියක් සවිකිරීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. | දෙපාර්තමේන්තුවේ පවතින ලේඛන ආරක්ෂා කර ගැනීම සඳහා පියවර ගත යුතු වේ. |

## 3.4. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ රු.25,300,000 ක ඇස්තමේන්තුවක් යටතේ ආරම්භ කළ සුවිපත්‍ර 500,000 ක් පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය 2019 වර්ෂයේ අවසන් කිරීමට කටයුතු යොදා තිබූ නමුත්, තාක්ෂණික නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හා නිවැරදි සැලසුමකට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කර වසර 09 ක කාලයක් ගතවුවද 2023 වසර අවසාන වන විටත් රු.13,489,788 ක් වැයකර අදාළ කාර්යය නිම කිරීමට නොහැකි වී තිබුණි. | මේ සඳහා දත්තානු දත්ත සැකසීමට අනුගමනය කරන අන්තර්ජාතික අධිලේඛන කවුන්සිලය මඟින් ප්‍රකාශයට පත් කර ඇති General International Standard Archival Description (ISAD(G) යන ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේදය අනුව දැනට අවසන් පරීක්ෂාව සිදු කර ඇති සුවිපත්‍ර ATOM මෘදුකාංගය හරහා දත්ත ගබඩාවේ ස්ථාපිත කිරීමට උපදේශකවරයකුගේ සේවය අත්‍යවශ්‍ය වේ. එය මෙම ව්‍යාපෘතිය යටතේ නොව 2021.04.05 දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දෙපාර්තමේන්තුව සඳහා විශ්වාසදායක ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට නියමිතය. එම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කාර්යයක් උපදේශක සමාගමක් තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | රජයේ අරමුදල් ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 ජනවාරි සිට 2021 මැයි දක්වා කාලය තුළ රු. 992,230,065 ක ඇස්තමේන්තුගත මුදලකින් නිම කිරීමට සැලසුම් කර තිබුණු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2023 දෙසැම්බර් 31 දිනට වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු නමුත්, ඉදිකිරීම් කටයුතු අවසන් නොකර අත්හැර දමා තිබුණු අතර, එදිනට රු.470,780,777 ක් ගෙවා තිබුණු එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 47 ක් ද, භෞතික ප්‍රගතිය සියයට 53 ක් ද විය. | සංශෝධිත ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමෙන් පසු ජූනි මස සිට ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල කඩිනමින් ඉදිකර අවසන් කළ යුතු වන බව. |
| (ඇ) | දෙපාර්තමේන්තු අධිලේඛන තැන්පත් කිරීම සඳහා අම්ල රහිත ලේඛන තැන්පතු පෙට්ටි 2,512 ක් රු.19,237,273 කට මිලදී ගැනීමට 2023 සැප්තැම්බර් 19 දින භාරදුන් ඇණවුම අනුව 2024 ජනවාරි 29 දින දෙපාර්තමේන්තුවට භාණ්ඩ ලැබී තිබුණි. එහි ගුණාත්මකබව රැක ගැනීම සඳහා සෙල්සියස් අංශක 20-24 අතර උෂ්ණත්වයක සහ 30%-50% අතර සාපේක්ෂ ආර්ද්‍රතාවය සහිත, හිරු එළියට නිරාවරණය නොවන, අක්‍රිය නොකරන ගද දේශගුනික පාලන පද්ධතියක් තුල වඩා හොඳ අම්ලකරණයක් සඳහා වානේ රාක්ක වල ගබඩා කර තැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම ආරක්ෂිත විධිවිධාන අනුගමනය නොකර 2024 මැයි 02 විගණිත දින දක්වා මාස 03 ක කාලයක් එම පෙට්ටි ගබඩාව තුළ බිම අසුරා නිශ්කාර්යව තිබීමෙන් දක්වන ලද නිර්නායක අනුව ගබඩා කර නොතිබීම තුල වසර 05 ක වගකීම් සහතිකය අවලංගු වීමේ අවධානමක් පැවතුණි. | මේ වන විට අදාළ කෝෂ්ඨාගාර වෙතින් මෙම ලේඛන තැන්පතු පෙට්ටි ගබඩාවෙන් ඉවත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | සැපයුම්කරු ඉදිරිපත් කළ කොන්දේසි ප්‍රකාරව කටයුතු කර වගකීම් සහතිකය ආරක්ෂා කර ගත යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 286 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 137 ක් හෙවත් සියයට 48 ක් පුරප්පාඩු වී පැවතුණු අතර, එය දෙපාර්තමේන්තුවේ ලේඛන හා අධිලේඛන කළමනාකරණය ප්‍රමාද වීම මෙන්ම අනාගත කාලයක් දක්වා විෂයානුබද්ධව නිලධාරීන්ගේ පසු පෙළක් නිර්මාණය කිරීම ඇතුලුව දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යසාධනය ළඟා කර ගැනීම කෙරෙහි අහිතකර ලෙසට බලපා තිබුණි. එම තනතුරු පුරප්පාඩු අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සියයට 50 ක්, තෘතියික මට්ටමේ තනතුරු සියයට 80 ක් හා ද්විතියික මට්ටමේ තනතුරු සියයට 64 ක් ඇතුළත් විය. | 2023 වර්ෂයේ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 26 ක් සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකායෙන් බඳවා ගෙන ඇත. දෙපාර්තමේන්තුගත තනතුරු 56 ක් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර බඳවා ගැනීම්වලට අදාළව ඉදිරි කටයුතු සිදු කරමින් පවති. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වන බව. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ලේඛන සංරක්ෂණ තනතුර සඳහා අනුමත 27 ක් වූ සේවක සංඛ්‍යාවෙන් 24 ක්ම පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් සංරක්ෂණය කළ යුතු තත්ත්වයේ පවතින ලේඛනවල සංරක්ෂණ කටයුතු ප්‍රමාද වී තිබුණි. | සංරක්ෂක තනතුරු 18 ක් සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමේ තරඟ විභාගය 2024 අප්‍රේල් 20 දින පවත්වා ඇත. විභාග ප්‍රතිඵල අනුව ඉදිරි බඳවා ගැනීම් කටයුතු සිදු කරනු ලැබේ. | දෙපාර්තමේන්තු කාර්යසාධනයට බලපාන තනතුරුවල පුරප්පාඩු අප්‍රමාදව පිරවීමට කටයුතු කල යුතුය. |